මුද්දර ලෝකය

# ලෝක කාලගුණ දිනය

**ලොව රටවල් සැලකිය යුතු ගණනක්, ශතවර්ෂ කිපයක සිට කාලගුණ තොරතුරු පිළිබඳව උනන්දුවක් දක්වා තිබේ. ලංකාවේ කාලගුණ නිරීක්ෂණය ආරම්භ කර ඇත්තේ 1859 වර්ෂයේදී ය. පසුව වඩා ක්‍රමානුකූල වූ කාලගුණ විද්‍යා නිරීක්ෂණ ජාලයක් මිනුම්පති කර්නල් ෆයර්ස් යටතේ වර්ෂ 1865 දී ආරම්භ කර ඇත.**

**අනුර සමරවීර**

සෑම වසරකම මාර්තු මස 23 දින 'ලෝක කාලගුණ දිනය' ලෙස නම්කර තිබේ. ලෝක කාලගුණ විද්‍යා සංවිධානයේ සාමාජිකත්වය දරන සියලුම රටවල් විසින් කාලගුණ විද්‍යාවේ වැදගත්කම පිළිබඳව ජනතාව ගේ අවධානය යොමු කරවීම සඳහා මෙම දිනය උපයෝගී කර ගැනේ. එදිනෙද වැඩකටයුතු හා අනාගතය සැලසුම් කිරීමේදී කාලගුණයෙන් සිදුවන බලපෑම් පිළිබඳව අවධානය යොමු කිරීම අත්‍යවශ්‍ය කටයුත්තක් බවට පත්වී තිබේ.

ලොව රටවල් සැලකිය යුතු ගණනක්, ශතවර්ෂ කිපයක සිට කාලගුණ තෙරතුරු පිළිබඳව උනන්දුවක් දක්වා තිබේ. ලංකාවේ කාලගුණ නිරීක්ෂණය ආරම්භ කර ඇත්තේ 1859 වර්ෂයේදී ය. පසුව වඩා ක්‍රමානුකූල වූ කාලගුණ විද්‍යා නිරීක්ෂණ ජාලයක් මිනුම්පති කර්නල් ෆයර්ස් යටතේ වර්ෂ 1865 දී ආරම්භ කර ඇත.

අන්තර්ජාතික කාලගුණ විද්‍යා සංවිධානය (International Meteorological Organization) 1873 දී බිහි විය. ලොව වටා සිදුකරන ලද කාලගුණ විද්‍යා ගවේෂණයන් සඳහා එමගින් හොඳ අඩිතාලමක් සැකසිණි. ලෝක යුද්ධ පැවති සමයන්හි දී ද කාලගුණ විද්‍යාව හැදෑරීම පිණිස විශාල උනන්දුවක් ඇති විය. පසුකලක එනම් 1951 දී අන්තර්ජාතික කාලගුණ විද්‍යා සංවිධානය, එක්සත් ජාතීන්ගේ විශේෂඥ ආයතනයක් ලෙස 'ලෝක කාලගුණ විද්‍යා සංවිධානය' (WMO) නමින් සිය මෙහෙවුම් කටයුතු ආරම්භ කරනු ලැබිණි. රට රටවල් අතර කාලගුණ තොරතුරු පිළිබඳව සම්බන්ධතා පවත්වා ගැනීම, පවතින එවැනි වැඩපිළිවල උසස් තත්ත්වයට ගෙන ඒම හා නවීන තාක්ෂණික ක්‍රම මගින් කාලගුණ විද්‍යාව දියුණු කිරීම එම සංවිධානය සතු මූලික කාර්යභාරය වේ. ශ්‍රී ලංකාව ද එය ආරම්භයේ දී ම එහි සාමාජිකත්වය හිමි කර ගෙන තිබේ.

කාලගුණ විද්‍යා ආයතනයක් සඳහා විශාල කාර්යභාරයක් පැවරී තිබේ. එදිනෙද කාලගුණ තොරතුරු සැපයීම, ස්වාභාවික විපත් වළක්වා ගැනීම සඳහා ක්‍රියාත්මක වීම, මුහුදු ගමන්, ගුවන් ගමන් සඳහා අවශ්‍ය කාලගුණික තොරතුරු සැපයීම, කාලගුණ අනාවැකි පළකිරීම, කෘෂිකර්මාන්තය සඳහා අවශ්‍ය කාලගුණ උපදෙස් සැපයීම, නක්ෂත්‍ර වේලාව, සම්මත වේලාව ආදිය දැක්වීම මෙන් ම කාලගුණ විද්‍යාත්මක අධ්‍යාපන හා පර්යේෂණ කටයුතු සඳහා දේශගුණික දත්ත සැපයීම ඒ අතරින් ප්‍රධාන තැනක් ගනී. මේ සඳහා කාලගුණ විද්‍යා ආයතනවල දියුණුව මෙන් ම අන්තර් සම්බන්ධතාව ද ඉතා වැදගත් වේ.

එක්සත් ජාතීන් ගේ මහා මණ්ඩලයේ සම්මත වූ 1721 (XVI) හා 1802 (XVII) සම්මුතීන්ට අනුකූලව සාම කටයුතු සඳහා දේශසීමාවන්ගෙන් බාහිර අභ්‍යවකාශය යොදා ගැනීමේ අන්තර්ජාතික සහයෝගිතාව ප්‍රතිචාර වශයෙන්, ලෝක කාලගුණ විද්‍යා සංවිධානය විසින් 1963 දී ජගත් කාලගුණ සෝදිසි වැඩසටහන (World Weather Watch) ආරම්භකරන ලදී. 'WWW' යන කෙටි නාමයෙන් හඳුන්වන මෙම වැඩසටහන ලෝක කාලගුණ විද්‍යා සංවිධානය විසින් පවත්වාගෙන යනු ලබන විශාලතම වැඩසටහන වේ.

කාලගුණ විද්‍යා දත්ත හා තොරතුරු රැස්කිරීමේ දී භූතල නිරීක්ෂණ හා උඩුගුවනේ නිරීක්ෂණ මගින් ඒවා ලබාගනු ලැබේ. භූතල නිරීක්ෂණයේදී සුළං දිසා දර්ශකය, අතිලමානය, ස්ටීවන්සන් ආවරණය, වායු පීඩන මාන, වර්ෂාමාන, සූර්ය දීප්ත මාන ආදී උපකරණ ප්‍රයෝජනයට ගැනේ. කලාපීය වශයෙන් චන්ද්‍රිකා තාක්ෂණය ඔස්සේ ගොඩබිම හා සාගරයේ කාලගුණ දත්ත ලබාගැනීම හා බෙදාහැරීම මගින් වඩා පුළුල් අන්දමින් කාලගුණ අනාවැකි සඳහා පරිසරය සැකසීම කාලගුණ සෝදිසි වැඩසටහනෙහි මූලික පරමාර්ථය යි. මෙම වැඩසටහන තුළින් පොළොව මතුපිට හා ගුවනේ කාලගුණ තත්ත්වයන් පිළිබඳව නිවැරදි හා පූර්ණකාලීන තොරතුරු ලබා ගැනීමට හැකිවීම නිසා එමගින් ඉතා සාර්ථක ප්‍රතිඵල ලබා දී තිබේ.

මෙම තොරතුරු ලබාගැනීම සඳහා භූ-ස්ථිතික චන්ද්‍රිකා (Earth - Synchronous Satellites) හා ධ්‍රැවීය කක්ෂගත චන්ද්‍රිකා (Polar - orbiting Satellites) ප්‍රයෝජනයට ගැනේ. ධ්‍රැවීය කක්ෂගත චන්ද්‍රිකා පොළොවට කිලෝ මීටර් 800-1000 අතර ඉහළින් උත්තර හා දක්ෂිණ ධ්‍රැව හරහා සුළු ආනතියක් ඇතිව කක්ෂගත වී දවසට දෙවරක් භ්‍රමණය වෙමින් චන්ද්‍රිකා ඡායාරූප ලබා දෙයි. භූ-ස්ථිතික චන්ද්‍රිකා පොළොවට කිලෝ මීටර් 36000 ක් පමණ දුරින් සමකයට සමාන්තරව ගමන් කරන අතර, පෘථිවියේ භ්‍රමණ වේගයෙන් ම කක්ෂගතව ඇති නිසා පෘථිවියට සාපේක්ෂව නිශ්චලව පවතින අයුරින් දිස්වෙයි. මෙවැනි චන්ද්‍රිකා ඇසකට පෘථිවියේ එක් අඩක් නිරතුරුවම පෙනෙන අතර පොළොව වටා ඇතිවන සුළං හා වලාකුළු පිළිබඳව දත්ත නොකඩවා ලබාදිය හැකි වේ. චන්ද්‍රිකා මගින් ලබාගන්නා වලාකුළු ඡායාරූප තුළින් චාසුලි හෝ අයහපත් කාලගුණ පද්ධතිවල හැසිරීම හා ගමන්මඟ පිළිබඳව මනාව අවබෝධ කරගත හැකි වේ.

සුළි සුළං හා කුණාටු මගින් විය හැකි අනතුරු දැනුම් දීම සඳහා රේඩාර් මධ්‍යස්ථාන හරහා ලැබෙන කාලගුණ රේඩාර් දත්ත ද ප්‍රයෝජනයට ගැනේ. ගුවන් ගමන් සේවා සඳහා වැදගත් කාලගුණ දත්ත, ගුවන් තොටුපළ කාලගුණ විද්‍යා කාර්යාල මගින් ක්ෂණිකව ලබාදීම ද කාලගුණ විද්‍යා ආයතන මගින් නිරතුරුවම සිදුකරන වැදගත් සේවාවකි. දීර්ඝ ගුවන් ගමන් සඳහා 'ලෝක ව්‍යාප්ත ජගත් කාලගුණ අනාවැකි මධ්‍යස්ථාන' මගින් නිකුත් කරන කාලගුණ සිතියම් ප්‍රයෝජනයට ගැනේ.

ශ්‍රී ලංකා කාලගුණ දෙපාර්තමේන්තුව වෙනම රාජ්‍ය ආයතනයක් ලෙස 1948 ඔක්තෝබර් 01 දින පිහිටුවා තිබේ. රටට සම්මත වේලාව සැපයීම, නක්ෂත්‍ර විද්‍යා තොරතුරු ලබාදීම හා ලෝක කාලගුණ විද්‍යා සංවිධානයේ හා ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානයේ නියමයන්ට අනුකූල වන සේ සියලුම ජාතික හා අන්තර්ජාතික සේවාවන් හා දත්ත සැපයීම එහි වගකීම වේ.

කාලගුණ විද්‍යා සේවය මුද්දර මගින් නිරූපනය වී ඇත්තේ සීමිතව ය. ශ්‍රී ලංකා කාලගුණ දෙපාර්තමේන්තුවේ 50 වන සංවත්සරය වෙනුවෙන් 1998 දී සමරු මුද්දරයක් නිකුත් කර තිබේ. චන්ද්‍රිකා මගින් කාලගුණ විද්‍යා තොරතුරු ලබාගැනීම පිළිබඳව, මුද්දර වැඩි ප්‍රමාණයක් නිරූපිතව ඇත. එක්සත් ජාතීන් ගේ මුද්දර මගින් 'ජගත් කාලගුණ සෝදිසි වැඩසටහනේ' අගය සිහිපත් කිරීම ද පැසසිය යුත්තකි. ❑